**කුලියාපිටිය ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූලි 15 දින ද සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කුලියාපිටිය ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගත් රු.1,583,800 ක් වටිනා ස්ථාවර වත්කම් ගිණුම්ගත කර නොතිබුණි. | මිලදී ගත් ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතු වේ. | එකඟ වේ. 2019 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී ජ'නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ආ) | රු.929,901 ක් වටිනා ණයහිමියන් ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම්ගත නොවූ වටිනාකම් ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේදී ජනල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | රු.7,845,474 ක් වූ ඉදිරිකිරීම් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේදී වැරදි නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ඈ) | ගිණුම් විෂයන් 5 කට අදාළව ගිණුම් හා උපයෝගී ලේඛන අතර රු. 6,964,935 ක නොසැසඳීම් පැවතුණි. | අදාළ නොසැසඳීම් හඳුනාගෙන නිවැරදි කිරීම් කළ යුතු වේ. | මෙම අයිතම උපලේඛනයට ඇතුළත් කළ ද ගිණුම් සඳහා ජනල් සටහන් කිරීමේදි අත්හැර ඇත. එම වෙනස ජනල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.65,184,822 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 70,720,262 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| I. | වරිපනම් හා බදු | 1,890,800 | 2,357,687 | 2,570,084 | 501,224 | 1,711,000 | 2,111,000 | 1,931,000 | 658,000 |
| II. | කුලී | 6,451,260 | 8,287,310 | 8,238,179 | 75 | 8,203,000 | 9,795,000 | 1,757,000 | 58,000 |
| III. | බලපත්‍ර ගාස්තු | 619,000 | 843,541 | 843,541 | 0 | 514,000 | 642,000 | 642,000 | - |
| IV. | වෙනත් ආදායම් | 158,190,200 | 174,447,606 | 147,922,921 | 218,695,900 | 138,826,000 | 156,227,000 | 149,192,000 | 156,993,000 |
| | එකතුව | 167,151,260 | 185,936,144 | 159,574,725 | 219,197,199 | 149,254,000 | 168,775,000 | 153,522,000 | 157,709,000 |

#### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වරිපනම්<br>සමාලෝචිත වර්ෂය අවසානයට රු. 188,958 ක් වූ වරිපනම් බදු ශේෂය තුළ වසර 03 කට වැඩි කාලයක සිට පැවත එන රු. 52,331 ක ශේෂයක් පැවතුණි. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිග බදු මුදල් අයකර ගැනීමට අවශ්‍ය ඉදිරි පියවර ගැනීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. |

(ආ) අක්කර බදු

-----------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ 03 ට වැඩි කාලයක සිට පැවත එන අක්කර බදු රු. 267,671 ක ශේෂයක් පැවතුණි. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සභාවේ ලේඛනවල පවතිනු ලබන අක්කර බදු තොරතුරුවලට අනුව ඉඩම් හිමිකරුවන් සොයාගැනීමට නොහැකිවීම සහ ඉඩම් පවුලේ සාමාජිකයින් අතරේ බෙදීයාම වැනි කරුණු නිසා ලේඛන තුළ තිබෙන අක්කර බදු ආදායම් අයකර ගැනීම අපහසු තත්ත්වයට පත්වී ඇති බව දන්වා සිටිමි. |

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 31,618,962 ක් හා මුද්දර ගාස්තු රු. 176,459,926 ක් විය. | අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ලැබිය යුතු දඩ මුදල් ලබාදෙන මෙන් ඉල්ලුම් කොට ඇති අතර මුද්දර ගාස්තු මුදලින් කුලියාපිටිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ 2018 වර්ෂයට අදාළ මුද්දර ගාස්තු පිළිබඳ තොරතුරු මේ දක්වා අප සභාවට ලැබී නොමැති අතර හිඟ මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සේවක අතිරික්තතා<br>------------------------<br>අනුමත කාර්යය මණ්ඩලය ඉක්මවා අනියම්/ කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 11 දෙනෙකු බඳවාගෙන තිබුණි. | අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා බඳවා ගැනීම් සිදු නොකිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

(ආ) සේවක ණය

| | | |
| --- | --- | --- |
| මිය ගිය, විශ්‍රාම ගිය සහ සේවය අතහැර ගිය සේවකයින් 14 දෙනෙකුගෙන් රු. 129,560 ක් අය විය යුතුව පැවතුණි. | මෙම ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**අභ්‍යන්තර විගණනය**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| අභ්‍යන්තර විගණන කටයුතු සඳහා පත් කරනු ලැබූ නිලධාරීන්ට සාමාන්‍ය රාජකාරිද පවරා තිබූ බැවින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් කළ නොහැකි වී තිබුණි. | අභ්‍යන්තර විගණන කටයුතු විධිමත්ව ඉටුකර සභාවේ අභ්‍යන්තර පාලනය විධිමත් කර ගැනීමටත්, වාර්තා පිටපත් විගණනය වෙත යොමු කිරීමටත් කටයුතු කළ යුතු වේ. | 2018 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර තිබූ අතර ඊට අනුව අභ්‍යන්තර විගණන කටයුතු සිදුකරන ලදී. |